ජාතික බලගැන්වීම

ගෘහස්ථ හිංසන විධාන

# පසුබිම

පවුල් සහ ගෘහස්ථ හිංසනය අනුමත කළ නොහැකිය. හිංසනයට ලක්වූවන්ගේ ආරක්ෂාව අතිශයින් වැදගත්ය.

ගෘහස්ථ හිංසනයට ලක්වූවන්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම පිණිස රට පුරා නව නීති හඳුන්වා දී ඇත.

අතීතයේදී, ගෘහස්ථ හිංසන විධාන (DVOs) ඒවා නිකුත් කළ ප්‍රාන්තය හෝ පළාතට පමණක් වළංගු විය.

දැන් එය වෙනස් වී ඇත.

2017 නොවැම්බර් 25 වන දින නව ගෘහස්ථ හිංසන විධාන පරිපාටිය ආරම්භ විය. 2017 නොවැම්බර් 25 දින සිට නිකුත් කරන ලද සියලුම ගෘහස්ථ හිංසන විධාන ස්වයංක්‍රීයවම ජාතික වශයෙන් පිළිගනු ලැබෙයි. එසේම ජාතික වශයෙන් බලාත්මකද වේ.

# හිංසනයට ලක්වූවන් ආරක්ෂා කිරීම

ජාතික ගෘහස්ථ හිංසන විධාන පරිපාටිය හිංසනයට ලක්වූවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා වන ආරක්ෂාව තර කරයි.

ඔබේ ගෘහස්ථ හිංසන විධානය ඕස්ට්‍රේලියාවේ වෙනත් ප්‍රාන්තයක හෝ පළාතක බලාත්මක වනු පිණිස එහි ලියාපදිංචිය සඳහා අයදුම් කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ.

ඔබට දැනට 2017 නොවැම්බර් 25 ට පෙර නිකුත් කරන ලද ගෘහස්ථ හිංසන විධානයක් ඇත්නම්, උසාවියකට අයදුම්පතක් යොමු කිරීමෙන් එය ජාතික මට්ටමින් පිළිගන්නා එකක් බවට පත්කර ගත හැකිය.

ඕස්ට්‍රේලියාවේ පුරා ඇති ආදේශීය උසාවියකට ජාතික වශයෙන් පිළිගත් ගෘහස්ථ හිංසන විධානයක් සංශෝධනය කළ හැකිය. එය නිකුත් කරන ලද්දේ කොහේද යන්න මෙහිදී බල නොපායි.

නිකුත් කරන ලද්දේ කෙදිනද යන්න නොතකා, සිය ප්‍රාන්තය හෝ පළාත තුළදී නිකුත් කරන ලද සියලු ගෘහස්ථ හිංසන විධානයන්ට අයත් කොන්දේසි බලගැන්වීමට ප්‍රාදේශීය පොලීසියට හැකිය.

හිංසනයට ලක්වූවන් සහ ඔවුන්ගේ පවුල් ගෘහස්ථ හිංසනයෙන් ආරක්ෂා කරන වත්මන් ප්‍රාන්ත සහ පළාත් නීති වෙනස් වී නොමැත.




# ගෘහස්ථ හිංසන විධාන බලගැන්වීම

ගෘහස්ථ හිංසන විධානයේ ඇති කොන්දේසි අනුව කටයුතු නොකිරීම සාපරාධී වරදකි.

ගෘහස්ථ හිංසන විධානයක් තවදුරටත් ප්‍රාන්ත හෝ පළාත් මායිම්වලට සීමා නොවේ. නිකුත් කරන ලද සියලු ගෘහස්ථ හිංසන විධානයන් ඕස්ට්‍රේලියාව පුරාවට බලපැවැත්වේ.

---

ඔබේ ප්‍රාන්තයේ හෝ පළාතේදී ගෘහස්ථ හිංසන විධානයක් මැදහත් වීමේ නියෝගයක්, පවුල් හිංසන විධානයක්, පරිගෘහිත ගෘහස්ථ හිංසන විධානයක් හෝ පරිහාර නියෝගයක් වශයෙන් හඳුන්වනු ලැබිය හැකිය.

---

අපට දැන් පෙරටත් වඩා හොඳින් ඕස්ට්‍රේලියානුවන් ආරක්ෂා කළ හැකියි
www.ag.gov.au/ndvos